# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,570 — 1965 නොවැම්බර් 27 වැනි සෙනසුරාදා — 1965.11.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

**12 (1) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය**

අධ්‍යාපන අධ්‍යක්ෂ තැන්පත් අර්නස්ට් හර්බට් ද අල්විස් වන මම, 1963 වර්ෂයේ ජනවාරි මාසයේ 15 වෙනි දින අංක 13,479 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ වූ පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද යා/කොළඹගම් හින්දු දෙමළ මිශ්‍ර පාසැලේ සියලුම දේපල රජය වෙනුවෙන් භාර ගැනීමට පාඨශාලා පරික්ෂක තැන්පත් වීරසිංහම් තර්මසංගරි මහතාට මෙයින් බලය පවරමි.

2. එකී වීරසිංහම් තර්මසංගරි මහතා රජය වෙනුවෙන් පූර්වෝක්ත දේපල භාර ගැනීම වැළැක්වීමට හෝ බාධා කිරීමට හෝ විරෝධය දක්වීමට උත්සාහ කරන සෑම පුද්ගලයෙක් ම එකී පනත යටතේ වරදකරුවකු වෙනුවා පමණක් නොව, එකී පනතේ 27 වෙනි වගන්තිය යටතේ දඬුවමට භාජන කරනු ලැබිය හැකි ද වේ.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

ජීඑස්/එන්එස්ජීඑච්/391,
අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
මැලේ වීදිය,
කොළඹ 2.
1965 නොවැම්බර් මස 22 වෙනි දින දී ය.

11—1246/1

---

### 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

**12 (2) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය**

පාඨශාලා පරීක්ෂක තැන්පත් වීරසිංහම් තර්මසංගරි වන මම, 1963 වර්ෂයේ ජනවාරි මස 15 වෙනි දින අංක 13,479 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ, 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වෙනි වගන්තිය යටතේ පැනවුණු පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද යා/කොළඹගම් හින්දු දෙමළ මිශ්‍ර පාසැලට අයත් දේපල 1965 වර්ෂයේ දෙසැම්බර් මස 24 වෙනි සිකුරාදා පෙරවරු 10.30ට, එකී යා/කොළඹගම් හින්දු දෙමළ මිශ්‍ර පාසැලේ දී රජය සඳහා ද, වෙනුවෙන් ද භාරගැනීමට අදහස් කරන බව, එම පාසලේ දේපල ගැන අයිතිවාසිකම් ඇති සියලු දෙනා වෙතම මෙයින් දැනුම් දෙමි.

(2) එම දේපලට අයිතිවාසිකමක් ඇති සියලු දෙනාම නැතහොත් ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් (1) ඡේදයෙහි සඳහන් වූ දිනයෙහි නියමිත වේලාවට එකී ස්ථානය වෙත පැමිණ එම දේපල රජය සඳහාද, වෙනුවෙන් ද භාරගැනීමට මට ඉඩ දෙන ලෙසත්, සහාය වන ලෙසත් නියෝග කරමි.

V. THARMASANGARY,
පාඨශාලා පරීක්ෂක.

අළවෙට්ටි,
1965 නොවැම්බර් මස 22 වෙනි දින දී ය.

11—1246/2


1667— ආර්. 10616—6,800 (65/11)

## 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### 12 (1) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය

අධ්‍යාපන අධ්‍යක්ෂ තැන්පත් අර්නස්ට් හර්බට් ද අල්විස් වන මම, 1965 වර්ෂයේ අප්‍රේල් මාසයේ 2 වෙනි දින අංක 14,368 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ වූ පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද යා/බටහිර කාරයිතිව් සයිව දෙමළ මිශ්‍ර පාසැලේ සියලුම දේපල රජය වෙනුවෙන් භාර ගැනීමට, පාඨශාලා පරික්ෂක තැන්පත් සංගරප්පිල්ලෙයි සපාපති මහතාට මෙයින් බලය පවරමි.

2. එකී සංගරප්පිල්ලෙයි සපාපති මහතා රජය වෙනුවෙන් පූර්වෝක්ත දේපල භාර ගැනීම වැලැක්වීමට හෝ බාධා කිරීමට හෝ විරෝධය දැක්වීමට උත්සාහ කරන සැම පුද්ගලයෙක් ම එකී පනත යටතේ වරදකරුවකු වෙනුවා පමණක් නොව, එකී පනතේ 27 වෙනි වගන්තිය යටතේ දඬුවමට භාජන කරනු ලැබිය හැකි ද වේ.

ඊ. එච්. ද් අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

ජීඑස්/එන්එස්ඒඑච්/401,
අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
මැලේ වීදිය,
කොළඹ 2,
1965 නොවැම්බර් මස 22 වෙනි දින දී ය.

11—1246/3

---

## 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### 12 (2) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය

පාඨශාලා පරික්ෂක තැන්පත් සංගරපිල්ලෙයි සපාපති වන මම, 1965 වර්ෂයේ අප්‍රේල් මස 2 වෙනි දින අංක 14,368 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ වූ, 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වෙනි වගන්තිය යටතේ පැනවුනු පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නාලද යා/බටහිර කාරයිතිව් සයිව දෙමළ මිශ්‍ර පාසැලට අයත් දේපල 1965 වර්ෂයේ දෙසැම්බර් මස 24 වෙනි සිකුරාද පෙරවරු 10ට, එකී යා/බටහිර කාරයිතිව් සයිව දෙමළ මිශ්‍ර පාසැලේ දී රජය සඳහා ද, වෙනුවෙන් ද භාරගැනීමට අදහස් කරන බව, එම පාසැලේ දේපල ගැන අයිතිවාසිකම් ඇති සියලු දෙනාම වෙතම මෙයින් දැනුම් දෙමි.

(2) එම දේපලට අයිතිවාසිකමක් ඇති සියලු දෙනාම නැතහොත් ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් (1) ඡෙදයෙහි සඳහන් වූ දිනයෙහි නියමිත වේලාවට එකී ස්ථානය වෙත පැමිණ එම දේපල රජය සඳහා ද, වෙනුවෙන් ද භාරගැනීමට මට ඉඩ දෙන ලෙසත්, සහාය වන ලෙසත් නියෝග කරමි.

S. SABAPATHY,
පාඨශාලා පරික්ෂක.

කාරයිනගර්,
1965 නොවැම්බර් මස 22 වෙනි දින දී ය.

11—1246/4

ලංකාවේ වාලච්චේනායෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි